# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය
# ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල
# නර්තනය
# 10 ශ්‍රේණිය

ඒකකය - 4.2.2. රබන් හා වන්නම් කවි ගයමින් සතුටු වෙමු

පැවරුම් අංකය - 03

❖ **සැවුලා වන්නම**

- උඩරට සම්ප්‍රදායට අයත් වන්නමකි.
- සැවුලා වන්නමෙන් සුර අසුර යුද්ධය හා සැවුල් උපත පිළිබඳ විස්තර වේ
- මාත්‍රා 2+4 තාල රූපයට ගායනා කරනු ලබන අතර සැවුලාගේ කඩිසර බව තාලරූපය මතුකොට පෙන්වයි.

තාලය

| ^ 1 2 | / 1 2 3 4 | ^ 1 2 | / 1 2 3 4 |
|---|---|---|---|
| දොං - | ජිං - ජිං - | ජිං - | ග ජි ග ත |

බෙර පදය

(මේ අයුරින් බෙර පදය තාල තබා පුහුණු වන්න)

තාලය - සුළු මහ (මාත්‍රා 2+4) දෙතිත

බෙර පදය - දොං දොං ජිං ජිං ගජිගත

තානම - තම් තම්දන තානම් දන තම්දන තානම්
තම් තම්දන තානත් තෙයි තම්ද නා තම්දෙ නා නා

කවිය - සුරිඳුන් පෙර සිටන් බලයුත් සවතිඳුන්
සහඟොස් කළ යුදෙන් අසු රන්ජය නොලදින්
බර අත් ගෙන කගින් ඇන කොන්තව් වලින්
අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්

ගසමින් කග පතින් දෙපලුව අසුර සෙන්
දැරුපා අතළුවෙන් පලු දෙක ගෙන සැනකින්
එම වන් පලුවකින් එ උපන් සැනයකින්
සැවුලා නම එයින් ලොව පළ කළ උපතින්

කස්තිරම - කුඳ ගජිගත /// කුඳ තා
කුඳ ගජිගත /// කුඳ තා
කුඳ ගජිගත කුඳ තා //
කුඳ තා //
කුඳ ගජිගත /// කුඳ තා

සීරු මාරුව - තකු තක තරිකිට කුංදත්
ගත් ජීත් තක ජීත් කුංදත්
තකු තක තරිකිට කුන්දත් දොං තා

අඩව්ව - ජෙන් තත් තත් /// ජෙන් තා - ජෙනු තත් තත් /// ජෙනු තා
ජෙන් තත් තත් ජෙන් තා - ජෙනු තත් තත් ජෙනු තා
ජෙන් තා - ජෙනු තා
දොහොකඩ තා - දොහොකඩ ගත කුඳ දොහොකඩ තා

## සැවුලා වන්නම

| | ∧ | | / | | | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| බෙර පදය | දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග |ත |
| තානම | තුම් | - | තම් | - | ද | න | තා | - | නම් | - | - | - |
| | ද | න | නම් | - | ද | න | තා | - | නම් | - | - | - |
| | නම් | - | නම් | - | ද | න | තා | - | තත් | - | තෙ | යි |
| | තුම් | - | ද | - | - | - | - | - | - | - | - | - |
| | + | + | නා | - | තම් | - | ද | - | නා | - | - | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | සු | රි | දුන් | - | පෙ | ර | සි | - | ටන් | - | - | - |
| | බ | ල | යුත් | - | සැ | ව | ති | - | දුන් | - | - | - |
| | ස | හ | ගොස් | - | ක | ළ | යු | - | දෙන් | - | - | - |
| | අ | - | සු | - | - | - | - | - | - | - | - | - |
| | + | + | රන් | - | ජ | - | ය | - | නො | - | ල | - |
| | දින් | - | - | - | - | - | - | - | - | - | - | - |
| කස්තිරම | කු | ඳ | ග | ජි | ග |ත | කු | ඳ | ග | ජි | ග | ත |
| | කු | ඳ | ග | ජි | ග | ත | කු | ඳ | තා | - | - | -// |
| | කු | ඳ | ග | ජි | ග | ත | කු | ඳ | තා | - | - | -// |
| | කු | ඳ | තා | - | - | - | කු | ඳ | තා | - | - | - |
| | කු | ඳ | ග | ජි | ග | ත | කු | ඳ | ග | ජි | ග | ත |
| | කු | ඳ | ග | ජි | ග | ත | කු | ඳ | තා | | | |
| සීරු | ත | කු | ත | ක | ත | රි | කි | ට | කුන් | - | දත් | - |
| | ග | ජී | ජිත් | - | ත | ක | ජීත් | - | කුන් | - | දත් | - |
| | ත | කු | ත | ක | ත | රි | කි | ට | කුන් | - | දත් | - |
| | දොං | - | තා | | | | | | | | | |
| අඩව්ව | ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තත් | - | තත් | - |
| | ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තා | | | |
| | ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තත් | - | තත් | - |
| | ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | | | |
| | ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තා | | | |
| | ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | | | |
| | ජෙං | - | තා | - | - | - | ජෙ | නු | තා | - | - | - |
| | දොහො | කඩ | තා | - | - | - | දොහො | කඩ | ග | ත | කු | ඳ |
| | දොහො | කඩ | තා | - | - | - | | | | | | |

# <u>රබන් කවි</u>




- රබන් කවි නර්තනයේදී භාවිතා කරයි.
- විවිධ නාද මාලා තාල රූප අනුව ගායනා කරයි.
- බෝධි සත්ව චරිත, කාන්තා ලාලිත්‍ය, ස්වභාව සෞන්දර්ය ගැන මෙම කවි වලින් විස්තර වේ.

නන් උතුම් පෙම්බර ගුණ රුසිරු රබානා
දැන් මෙමන් අතින් රැගෙන කරකවමි මනා
පෙම් සිතින් බලනු මැනවි දෙනෙත් පාමිනා
සන්තොසින් අසනු මැනවි කිම වෙන වෙනා

අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රුවින්
ගතසිත බැඳ සොලවා සිලි සිලි නද කරමින්
සිතකටවත් නොගෙන රහති විදුලිය විලසින්
අහසට දමමින් අල්ලා රබාන දැතින්

(මාත්‍රා 3 තාල රූපය)

මැදුම් (මාත්‍රා 3) තනි තිත තාලය

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | අත | ක | ට | ගෙ | න | ර | බන් | - | පො | ඩි | ය |
| + | වය | ති | දි | සි | රු | වින් | - | - | - | - | - |
| + | ගත | සි | ත | බැ | ඳ | සො | ල | වා | - | සි | ලි |
| + | සිලි | න | ද | ක | ර | මින් | - | - | - | - | - |
| + | සිත | ක | ට | වත් | - | නො | ගෙ | න | ර | හ | ති |
| + | විදු | ලි | ය | වි | ල | සින් | - | - | - | - | - |
| + | අහ | ස | ට | ද | ම | මින් | - | අල් | - | ලා | - |
| + | ර | බා | න | දැ | - | තින් | - | - | - | - | - |

ත්‍රිවිධ ඥාන විදුරු පඩි අපෙ මහ ගෞතම නම් මුනිඳු..........
ඒ බුදු වූ ගෞතම නම් මුනිඳු..........

දෙසූ දහම් ඇසුමට ඒ නිමලා -විසූ භවය යකුගෙන් තතු දැනලා
නසා ලන්ට කිවි දිවි අසලා බණ -දෙසූ විදුර පණ්ඩිතමයි ගෞතම

එදා එ ඇතු විදුමට ආ වැදි හට - පුදා එ දළ දෙක දී ලා දැතට
සදා එ බුදු බව පැතු මාතා හට - පුදා වදිමු අපි මල් ගෙනදෝතට

(මාත්‍රා 4+4 තාල රූපය)

**රබන් කවි - ත්‍රිවිධ ඥාන විදුරු**

මහ (මාත්‍රා 4) තනි තිත තාලය

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ත්‍රිවි | ධ | ඥා | - | න | - | විදු | රු | - | - | පඩි | අ | පෙ | ම | හ |
| + | ගෞ | ත | ම | නම් | - | මු | නි | ඳු | - | - | ඒ | බු | දු | වූ | - |
| + | ගෞ | ත | ම | නම් | - | මු | නි | ඳු | - | - | - | - | - | - | - |
| + | දෙ | සූ | ද | හම් | - | ඇ | සු | ම | ට | ඒ | - | නි | ම | ලා | - |
| + | වි | සූ | භ | ව | ය | ය | කු | ගෙන් | - | ත | තු | දැ | න | ලා | - |
| + | න | සා | ලන් | - | ට | කිවි | - | දි | වි | අ | ස | ලා | - | බ | ණ |
| + | දෙ | සූ | වි | දු | ර | පණ් | - | ඩි | ත | ම | යි | ගෞ | - | ත | ම |

රටකට මව් සමගින් එනැව් නැග යන කල අපෙ මුණිඳුන්
මකරෙට ගැසු සුළඟින් එනැව බිඳ සමුදුර මැද ගිලුනෙන්
උරපිට මව් තබමින් සතියක් පීනල ගොඩ නැගුනෙන්
අටවිසි මුනිඳු බලෙන් අපහට අවසර ලැබෙනු සබෙන්

(මාත්‍රා 4+4 තාල රූපය)

## <u>කාර්ය පත්‍රිකාව</u>

I. සැවුලා වන්නමෙන් විස්තර කරන්නේ කුමක් ගැනද?
II. සැවුලා වන්නම අයත් තාල රූපය කුමක්ද?
III. සැවුලා වන්නමේ බෙර පදය ප්‍රස්තාර කරන්න?
IV. බෝධිසත්ව චරිතය ඇසුරින් නිර්මාණය වී ඇති රබන් කවිය ලියන්න.
V. "අතකට ගෙන රබන් ................ " කවිය ගායනා කරන තාල රූපය නම් කරන්න.